**ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය**

**විෂය:- මව්බස**

**කාර්ය පත්‍රිකාව :- කාර්ය පත්‍රිකා 5**

**ශ්‍රේණිය:- 5 ශ්‍රේණිය**

- **ඡේද ඇසුරින් පිළිතුරු සැපයීම**
  - පහත ඡේදය කියවා අසා ඇති <u>ප්‍රශ්න වලට පිළිතුරු වාචික</u> ලබා දෙන්න.

පවනිගේ යාළුවෝ සියලු දෙනා ම පන්තියට සහභාගී වූහ.

“අද අපි අකුරුත් එක්ක සෙල්ලම් කරනවා. හැමෝම ඒකට සහභාගී වෙන්න ඕනෑ” පවනි හැමෝටම ඇහෙන්න හයියෙන් කිව්වා ය .

“ඉස්සෙල්ලා මම පිළි නැති අකුරක් කියනවා .ඊට පස්සේ ඉස්සරහම ඉන්න කෙනා ඒකට පිල්ලමක් දාලා කියන්න ඕනෑ .ඊලඟට ඉන්න කෙනා තවත් පිල්ලමක් දාලා කියන් ඕනෑ. හැමෝටම තේරුනාද?” පවනි ඇසුවා .

1) පන්තියට සහභාගී වූ අයගේ නම් කියන්න?

2) පවනි හැමෝටම ඇහෙන්න හයියෙන් කිවූ දෙය කියන්න?

3) පවනි හයියෙන් කීවේ කාට ඇහෙන්නද?

4) <u>**ඉදිරියෙන්ම**</u> යන්නට සමාන පදයක් ඡේදයෙන් සොයා කියන්න?

5) ඡේදය ඇති ස්ත්‍රී ලිංග අතීත කාල ක්‍රියා පදයක් සොයා කියන්න?

6) මුල් අකුරට ඇදය යෙදෙන වචනයක් කියන්න?

7) යහළුවන් යන්න ඒක වචන පදය කියන්න?

8) <u>**අපි**</u> යන වචනයේ ඒක වචන පදය කියන්න?

9) මූර්ධජ අකුරක් යෙදෙන වචනය කියන්න?

10) පන්තියේ කරන සෙල්ලම් විස්තර කරන්න?

- **ඡේදය ඇසුරින් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

“මෙය අඹ ගසක් මෙන් පෙනුනත් අඹ ගසක් නොවේ.මෙය විෂ සහිගසකි. මෙමගෙඩි වල නම “කිම්එල” යි.කිම්එල විෂ සහිත නිසා මරණය පවා සිදුවි හැකියි.ඔබ කඩාගත් ගෙඩි ඉවත දමන්න”
ගෙඩි අත තිබූ අය වහා ඒවා ඉවත දැමූහ.ඇතැමුන් ගෙඩි අනුභව කළ බව නායක සිටුතුමාට දැනගන්නට ලැබුණි.

1) විෂ සහිත ගසේ තිබුණ ගෙඩි වල නම කුමක්ද?

2) කිම් එල ගස පෙනෙන්නේ කුමන ගසක් මෙන්ද?

3) ඇතැමුන් ගෙඩි අනුභව කළ බව දැන ගන්නට ලැබුනේ කාටද?

4) අනුභව යන වචනයේ දෙවන අකුරට යෙදී ඇති පිල්ලම් කුමක්ද?

5) රහිත යන වචනයේ විරුද්ධ වචනය සොයා ලියන්න?

6) ඉක්මනට යන පදයට ගැළපෙන පදය ලියන්න?

7) අතීත කාල බහු වචන ක්‍රියා පදයක් තෝරා ලියන්න?

8) ගෙඩි යන වචනය ඒක වචන කර ලියන්න?

9) පුද්ගල නාම පදයක් තෝරා ලියන්න?

10) මහප්‍රාණ අකුරක් සහිත වචනය ලියන්න?

## පෙර වැඩ

- **පහත ඡේදය කියවා රස විඳින්න**

| |
|---|
| අපි රෝද පාර දිගේ වනය තුළට රිංගුවෙමු.තොරතෝංචියක් නැතිව නැගෙන කුරුලු ගීතයෙන් නිහැඬියාව මැකී යයි.මිනිස් කට හඬක් අසන්නට නැති බැවින් කුරුලු ගීතය වුව ද<br>සිත සලිත කරවීමේ බලයක් ලබා ඇත.ගස් දෙකක් එකට ඇතිල්ලී නැගෙන ක්‍රීං....ක්‍රීං.... නාදය ගස් අතරින් රිංගා ඈතට ම දිවයයි.අත්තෙන් අත්තට පනින රිලා වඳුරු සේනාව අප දෙස බලා සිටින්නේ අප බිය ගන්වන විලසයකිනි.කන් බිහිරි කරවන රැහැයි නාදය වන ගැබේ පාළුව බිය මුසු හැඟුම් ජනනය කරවයි. |

## <u>පසුවැඩ</u>

- **පහත ඡේදය ඉතිරි කොටස සම්පූර්ණ කරන්න.(වාක්‍ය පහක් පමණ)**

පාන්දරින් ම අවදි වන පාරමී පාසල් යාමට සූදානම් වෙයි.ඇය පෙර දින පාඩම් කළ පොත බෑගයට දමයි.පාසලේ සීනු හඬ නිවසටම ඇසෙන අතර පාරමී දෙමාපියන් ගේ පා වැඳ පාසල වෙත යයි.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

**සැකසුම:- වී.පී.දිල්රුක්ෂි**

**ර/ඇඹි/වීරබා ආදර්ශ විද්‍යාලය**